ඵෙණපිණ්ඩූපමසුත්තං
05.01.2019 - ශ්‍රී ලංකාරාමය
නවසීලන්තය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

හොඳයි සැම දෙනාටම තෙරුවන් සරණයි! ශ්‍රද්ධාවන්ත පින්වත්නි, අපි මේ වේලාවේ සූත්‍ර දේශනාවක් ඉදිරිපත් කරනවා. මේ සූත්‍ර දේශනාව බුදුරාජාණන්වහන්සේ පෙණපිඬක් උපමා කරගෙන දේශනාකොට වදාළ සූත්‍ර දේශනාවක්. පෙණ කැටියක් ඉදිරිපත් කරගෙන ගැඹුරු ධර්මයක් බුදුරජාණන්වහන්සේ මෙයින් කියලා දෙනවා. අපි මේ තිබෙන්නා වූ නිධානයත් එක්ක බලමු.

එක් කාලයක බුදුරාජාණන්වහන්සේ අයෝධ්‍යා කියන පළාතේ ගංගාවක් අසබඩ වැඩ ඉන්නවා. ඒ අයෝධ්‍යා කියන නගරයේ අයෝධ්‍යා කියන නදී තීරයේ භික්ෂූන් වහන්සේලා සමග වැඩ ඉන්න කාලයේ උන්වහන්සේට දකින්න ලැබිච්ච දෙයක් අරමුණු කරගෙන බුදුරාජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට කථා කරනවා. කථා කරලා බුදුරාජාණන් වහන්සේ කල්පනා කරනවා මේ දැකපු දේ මුල් කරගෙන මේ භික්ෂූන් වහන්සේලාට විශේෂ ධර්ම කොට්ඨාසයක් කියලා දෙන්න ඕන කියලා. ඉතිං එහෙම හිතලා ස්කන්ධ ධර්මයන් මුල් කරගෙන බුදුරාජාණන් වහන්සේ ධර්ම කොට්ඨාසයක් දේශනා කරනවා.

"සෙය්‍යථාපි, භික්ඛවෙ, අයං ගඞ්ගා නදී මහන්තං ඵෙණපිණ්ඩං ආවහෙය්‍ය = මහණෙනි මේ ගංගා නදියේ ලොකු පෙණ ගුලියක් ගහගෙන යනවා.

පෙණ ගුලියක් කියලා කියන්නේ එක පෙණ පිඬක් නොවෙයි. දිය බුබුලයි පෙණ කැටියයි කියන්නේ දෙකක්. අපි දැකලා තියෙනවා ගෙම්බෝ සමහර තැන් වල පෙණ දාල තිබෙනවා. ඒක බුබුළු බුබුළු මහා ගොඩක් එකතු වෙච්ච එකක්. පෙණ පිණ්ඩු කියලා කියන්නේ ඒ වගේ එකකට. ඒක දිය බුබුලක් වගේ එක පාරම කැඩෙන්නේ බිඳෙන්නේ නැහැ. ඒවා හරියට ලාටු වගේ. සමහර වෙලාවට තිබෙනවා දිය සෙවෙල් වාගේ තිබෙන්නා වූ දේවල්වලින් හැදෙන පෙණ කැටි. එවාත් එක පාරම කැඩිලා බිඳිලා යන්නේ නෑ. ඒවා සදාකාලික කියලා කියනවා නොවෙයි ඒවත් කැඩෙනවා, නමුත් ටිකක් දුර ගිහිල්ලා. ආන්න ඒ වගේ පෙණ පිඬක් වතුරේ ගහගෙන යනවා.

තමෙනං චක්ඛුමා පුරිසො පස්සෙය්‍ය = ඉතිං මේ පෙණ පිඩුව ගලාගෙන යන බව ඇස් තිබෙන්නා වූ මනුස්සයෙක් දකිනවා.

නිජ්ඣායෙය්‍ය යොනිසො උපපරික්ඛෙය්‍ය = දැකලා හොඳට හිත යොදලා බලනවා. බලලා ඒ පෙණ පිඩුව ගැන නුවණින් මෙනෙහි කරනවා. එහෙම පෙණ ගුලියේ තිබෙන ස්වභාවය දෙස බලන කොට මේක පෙණ ගුලියක්, මේක ගලාගෙන යනවා, මේක තව ටිකකින් නැතිවෙන්න පුළුවන් නැත්නම් තව ටිකක් දුර ගිහිල්ලා නැතිවෙන්න පුළුවන්, ඈතට ගිහිල්ලා නැතිවෙන්න පුළුවන් කියලා හොඳට බලනවා.

තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො = එහෙම මෙනෙහි කරෙගන යනකොට හොඳට නුවණින් දකිනකොට

රිත්තකඤ්ඤෙව ඛායෙය්‍ය, තුච්ඡකඤ්ඤෙව ඛායෙය්‍ය, අසාරකඤ්ඤෙව ඛායෙය්‍ය = මේක හිස්, ඒවාගේම වැඩකට නැති තුච්ඡ අසාර දෙයක් හැටියට ඔහු හඳුනා ගන්නවා.

කිඤ්හි සියා, භික්ඛවෙ, ඵෙණපිණ්ඩෙ සාරො? = මොකක්ද මේ පෙණ පිඩුවක තිබෙන්නා වූ සාරය, හරය?

හරය කියලා කියන්නේ යම්කිසි ගහක් කැපුවහම ඒකෙ තිබෙන අරටුවක් කියලා හයියට තිබෙන වැඩකට ගන්න පුළුවන් කැඩෙන්නේ බිඳෙන්නේ නැති සාරවත් කොටස. මොකක්ද මේ පෙණ පිඩුවක තිබෙන්නා වූ සාරය? කියලා මේ ඇස් තිබෙන කල්පනා කරන්න පුළුවන් නුවණැති පුද්ගලයා මෙනෙහි කරනකොට මේකේ කිසිම හරයක් නැති තුච්ඡ පහත් දෙයක් කියලා පෙණ පිඩුව පිළිබඳව තීරණයකට යනවා.

එවමෙව ඛො, භික්ඛවෙ = මහණෙනි ආන්න ඒ වගේ තමයි

යං කිඤ්චි රූපං = යම් කිසි රූපයක්

අතීතානාගතපච්චුප්පන්නං = අතීත අනාගත වර්තමාන යන කාල තුනේ

අජ්ඣත්තං වා බහිද්ධා වා = ඇතුලත රූපයක් හෝ වේවා බාහිර රූපයක් හෝ වේවා

ඔළාරිකං වා සුඛුමං වා = ගොරෝසු රූපයක් හෝ වේවා සියුම් රූපයක් හෝ වේවා

හීනං වා පණීතං වා = පහත් ලෙස සලකන රූපයක් හෝ උසස් ලෙස සලකන රූපයක්

යං දූරෙ සන්තිකෙ වා = දුර තිබෙන්නා වූ රූපයක් හෝ වේවා ළඟ තිබෙන රූපයක් හෝ වේවා

තං භික්ඛු පස්සති නිජ්ඣායති යොනිසො උපපරික්ඛති = මේ ඇස් තිබෙන කල්පනා කරන්න පුළුවන් නුවණැති පුද්ගලයා පෙණ පිඩුව යම්කිසි අකාරයකට බැලුවද ඒ පෙණ පිඩ හරයක් නැති තුච්ඡ දෙයක් හැටියට සැලකුවාද මේ අතීත අනාගත වර්තමාන දුර ළඟ අජ්ඣත්ත බහිද්ධ ඔළාරික සුඛුම හීන පණීත දුර ළඟ වශයෙන් තිබෙන මේ රූප සියල්ල පිළිබඳවත් මේ අයුරින් හිතනවා, මෙනෙහි කරනවා, සලකනවා. මේ අයුරින් රූපය මෙනෙහි කරකොට ඒ රූපයේ තිබෙන දේවල් ඇත්ත වශයෙන්ම හිස්. අපිට ඝන සංඥාව නිසා රූපයේ තිබෙන්නා වූ සියුම් විනාශය පේන්නේ නෑ. දැනේන්නේ නෑ. එහි

හරයක් නැති බව අපිට තේරෙන්නේ නෑ. හැබැයි හොඳට නුවණින් මෙනෙහි කරනකොට ඕක වැටෙහෙන්න පටන් ගන්නවා. බුදුරාජාණන් වහන්සේ අර පෙණ පිඩුව උපකාර කරගෙන රූපය පිළිබඳව මෙනෙහි කරන ආකාරය දක්වපු විදියයි මේ.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස මෙතැන රූපයේ උසස් පහත් කියලා කිව්වේ මොකක්ද?

<u>පිළිතුර</u> - ඇත්තටම රූප ඔක්කොම එකයි නමුත් අපි හොඳ රූප හොඳ නැති රූප කියලා දෙකට බෙදා ගන්නවා. මට මතකයි එක්කෙනුකුට එයාගේ ජීවිතය බේරා ගන්න වකුගඩුවක් උවමනා උනා. එයාට උවමනා වකුගඩුවක් තිබුණා, නමුත් එයා ඒක ගන්න කැමති උනේ නෑ. ඒකට හේතුව ඒ වකුගඩුව අයිති කෙනා මැරිලා. එයාට ජීවිතෙත් ඕනෑ. ජිවිතිය පවත්වා ගන්න වකුගඩුවකුත් ඕනෑ. නමුත් එයා ඒ මැරිච්ච කෙනාගේ වකුගඩුව ගන්න කැමති උනේ නෑ. එයා ඒ රූපය හීනයි කියලා සැලකුවා. එයා හොඳයි කියලා හිතන්නේ ජීවත්වෙලා ඉන්න කෙනෙකුගේ වකුගඩුවක්. දැන් අයිතිකාරයා නැති නිසා එයාට ඒකේ quality මදි. අපි හිතමු හිඟන්නෙක් ඉන්නවා. එයා කැමතියි වකුගඩුවක් දෙන්න. නමුත් ගන්න කෙනා කැමති නෑ. ඒ අය රූපය මනින විදිය තමයි ඒ.

"සෙයයථාපි, භික්ඛවෙ, සරදසමයෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ = මහණෙනි මහා වැසි කාලේ හොඳටම වහිනකොට වතුර උඩට වතුර වැටෙනවා.

උදකෙ උදකපුබ්බුළං උප්පජ්ජති චෙව නිරුජ්ඣති ච = වහින කාලයට එහෙම වතුර වැටෙනකොට දිය බුබුල් ඇතිවෙනවා. එසේ ඇතිවෙන බුබුල් සැනකින් නැතිවෙනවා. ඒක තමයි ස්වභාවය.

තමෙනං චක්ඛුමා පුරිසො පස්සෙය්‍ය නිජ්ඣායෙය්‍ය යොනිසො උපපරික්ඛෙය්‍ය = ඇස් ඇත්තා වූ පුරුෂයෙක් මෙන්න මේ කාරණය දැකලා බලලා හොඳට මෙනෙහි කරනවා.

මෙහෙම නුවණින් හොඳට මෙනෙහි කරනකොට ඒ හැදෙන්නා වූ දිය බිංදු වල දීර්ඝ කාලීනව තිබීමක් පැවැත්මක් මොකක්වත් නෑ. දැන් ඉස්සෙල්ලා කිව්ව පෙණ පිඩුවේ කථාවත් මේ දිය බුබුලේ කථාවත් වෙනස්. බැලුවහම දෙකම ඒක වගේ නමුත් පෙණ පිඩුව ටිකක් වෙලා තිබෙනවා. නමුත් දිය බුබුල එහෙම නොවෙයි. මේක ඇති වෙච්ච ගමන්ම නැති වෙනවා. අර පෙණ පිඩුව වතුරට වැටිලා ගලාගෙන යනවා. නමුත් මෙතැනදී කියන්නේ දිය බුබුල හැදෙනවා නැතිවෙනවා. මෙහෙම බලාගෙන යනකොට පෙණ පිඩට වඩා වේගයෙන් දිය බිංදු කැඩිලා බිඳිලා යනවා.

එවමෙව ඛො, භික්ඛවෙ, යා කාචි වෙදනා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තා වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යා දූරෙ සන්තිකෙ වා, තං භික්ඛු පස්සති නිජ්ඣායති යොනිසො උපපරික්ඛති = ආන්න ඒ වගේ මහණෙනි, මේ ජීවිතිය තුල පහළ වෙන්නා අතීත වූ වේදනාව අනාගත වූ වේදනාව වර්තමානයේ ඇති වී නැති වී යන වේදනාව තමා තුල ඇති වේදනාව බාහිර වේදනාව හොඳ හෝ නරක හෝ ඕලාරික හෝ සියුම් වූ යම් කිසි වේදනාවක් ඇත්ද ආන්න ඒ වේදනාව සම්බන්ධයෙනුත්

අර දිය බුබුල දිහා බලනවා වගේම හිත යොදලා නුවණ යොදලා සිහිය යොදලා හොඳට මෙනෙහි කරනවා.

එහෙම බලන කොට ඒ බලන කෙනාට අසාර බවක් හිස් බවක් තුච්ඡ බවක් පහත් බවක් වැටහෙනවා.

ඊළඟට බුදුරාජාණන් වහන්සේ අහනවා **කිඤ්හි සියා, භික්ඛවෙ, වෙදනාය සාරො?** = වේදනාවේ සාරය හැටියට කුමක්ද තිබෙන්නේ කියලා. මොකක්ද හොයා ගන්න පුළුවන් වෙන්නේ කියලා.

අපි ඊයේ   විඳපු වේදනාව දැන් නෑ. උදේ විඳපු වේදනාව දැන් නෑ. හැම එකක්ම ඒ ඒ වේලාවට ඇති උනා. නැති වෙලා ගියා. වේදනාවේ ස්වරූපය ඔය විදියයි. උපමා දෙකක් බුදුරාජාණන් වහන්සේ ගන්නවා. ඒ උපමාවන්ගෙන් බුදුහාමුදුරුවෝ ලස්සනට ජීවිතියේ නිස්සාරත්වය අසාරත්වය එවාගේම බාල බව හරියට කියලා දෙනවා. ඒක ඉතින් කෙලෙසුන්ගෙන් පිරිලා නිසා වටහා ගන්න එක තමයි කෙනෙකුට අමාරුයි. අපි ඉන්න මට්ටමෙන් එහාට හිත රිංගවා ගන්න හරි ආමාරුයි. මේ විදියට වේදනාව ගැන මෙනෙහි කිරීම සඳහා උන්වහන්සේ යොදා ගත්තේ ජල බුබුල.

ඒවගේම

"සෙය්‍යථාපි, භික්ඛවෙ, ගිම්හානං පච්ඡිමෙ මාසෙ යීතෙ මජ්ඣන්හිකෙ කාලෙ මරීචිකා ඵන්දති.

ගිම්හානං පච්ඡිමෙ මාසෙ කියලා කියන්නේ ජූනි මාසයේ. ඒකට කියනවා ගිම්හාන මාසයේ අවසාන කාලය කියලා. ඒ කාලයේදී **මරීචි ඵන්දති** කියලා කියනවා. **මරීචි ඵන්දති** කියලා කියන්නේ මිරිඟුව දඟලනවා කියන එකයි. **ඵන්දනය** = සැලෙනවා. පාර දිහා බැලුවහම වතුර වගේ පේනවා.

තමෙනං චක්ඛුමා පුරිසො පස්සෙය්‍ය නිජ්ඣායෙය්‍ය යොනිසො උපපරික්ඛෙය්‍ය = ඇස් තිබෙන්නාවූ කෙනෙක් ඥාවන්ත කෙනෙක් කල්පනා ශක්තිය තිබෙන්නා වූ කෙනෙක් ඒ මිරිඟුව දකිනවා. දැකලා බලලා නුවණින් මෙනෙහි කරනවා. නුවණින් මෙනෙහි කරනකොට එයාට තේරෙනවා මේක මිරිඟුවක්. මේකේ හයිය දෙයක් ඇත්තක් හොයා ගන්න   නෑ කියලා එයාට තේරෙනවා. මිරිඟුව දුරට ගියහම එක විදියකට පේනවා ළඟට ගියහම තව විදියකට පේනවා. දුරට පේනවා වතුර තිබෙනවා වගේ ළඟට හියහම නෑ. දුරට ගියහම ගින්දර දළු වගේ පේනවා. ළඟට ගියහම නෑ. මිරිඟුවෙ හැටි එහෙමයි.

ආන්න ඒ වගේ **'සෙය්‍යථාපි, භික්ඛවෙ, ගිම්හානං පච්ඡිමෙ මාසෙ** = ගිම්හාන ඍතුවේ අවසාන කාලයේදී මිරිඟුව දඟලනවා පේනවා වගේ නීල වශයෙන් පීත වශයෙන් ඕදාත වශයන් යම් කිසි සංඥාවක් තිබෙනවාද ආන්න ඒ සංඥාව පිළිබඳවත් ඒ ඥානවන්ත කෙනා හොඳට මෙනෙහි කරනවා   බලනවා කල්පනා කරනවා මොකක්ද   මේ සංඥාවේ තිබෙන්නා වූ ගැම්ම, මොකක්ද සංඥාවේ තිබෙන්නා වූ හයිය, මොකක්ද සංඥාවේ

තිබෙන්නා වූ සාරය කියලා. බලාගෙන යනකොට එහි තිබෙන හිස් බව ඒවාගේම මොකක්වත් නැති බව ඒවාගේම තුච්ඡ බව සාරයක් නැති බව හොඳට දැනෙනවා.

කිඤ්චි සියා, භික්ඛවෙ සඤ්ඤාය සාරො? = මොකක්ද මහණෙනි සංඥාවේ තිබෙන්නාවූ සාරය?

මුලින් බුදුරජාණන් වහන්සේ උපමාවක් දක්වනවා මිරිඟුවේ තිබෙන්නාවූ ස්වභාවය. ඊළඟට ඒකට ගලපලා දක්වනවා සංඥාවත් ඒවගේ කියලා. දුරට පෙනෙන දේ නොවෙයි ළඟට ගියහම. හොඳයි කියලා අපි සටහන් කරගන්නවා සලකුණු කරගන්නවා ඒ උනාට ඒ හොඳයි කියලා හිතපු දේ ළඟට ගිහිල්ලා නුවණින් බැලුවහම ඒක විනාස වෙලා නැතිවෙලා යනවා.

ඊළඟට බුදුරාජාණන් වහන්සේ මෙසේ දේශනා කරනවා.

"සෙයාථාපි, භික්ඛවෙ, පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො = මහණෙනි යම්සේ හරයක් හොයන්නා වූ අරටුවක් හොයන්නා වූ වටිනා දෙයක් හොයන්නා වූ පුරුෂයෙක්

තිණ්හං කුඨාරිං ආදාය වනං පවිසෙයා = හොඳට කැපෙන්නා වූ කෙටේරියක් අතේ තියාගෙන කැලේට යනවා.

සො තත්ථ පස්සෙයා මහන්තං කදලික්ඛන්ධං උජුං නවං අකුක්කුකජාතං තමෙනං මූලෙ ඡින්දෙයා = මෙහෙම යනකොට මොහුට කෙළින් වූ කෙසෙල් කඳක් දකින්න ලැබිලා එය මුලින්ම කපනවා.

මූලෙ ඡෙත්වා අග්ගෙ ඡින්දෙයා, අග්ගෙ ඡෙත්වා පත්තවට්ටිං විනිබ්භුජෙයා = මුල කපලා ගසේ අගත් කපනවා. දැන් තිබෙන්නේ කෙසෙල් කඳ පමණයි. ඊළඟට ඔහු කෙසෙල් කඳේ පොතු ගලවනවා.

සො තස්ස පත්තවට්ටිං විනිබ්භුජන්තො ඵෙග්ගුම්පි නාධිගච්ඡෙයා, = මෙසේ කෙසෙල් කඳේ පොතු ගලවන ඔහුට කිසිම හරයක් හමුවෙන්නේ නෑ.

කුතො සාරං! = කොහෙද හරයක්?

තමෙනං චක්ඛුමා පුරිසො පස්සෙයා නිජ්ඣායෙයා යොනිසො උපපරික්ඛෙයා. තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායෙයා, තුච්ඡකඤ්ඤෙව ඛායෙයා, අසාරකඤ්ඤෙව ඛායෙයා = ඥානවන්ත කෙනාට තේරෙනවා හරයක් වටිනාකමක් ඇති දෙයක් හොඳ අරටුවක් මේ කෙසෙල් කඳ ඇතුලේ නෑ කියලා.

ඒ මනුස්සයා පොතු ගැලෙව්වා ගැලෙව්වා අවසානයේදී මොකක්වත් හම්බ උනේ නෑ. මේ ඥානවන්ත මනුස්සයා හොඳට කල්පනා කරනවා ගලවලා ගලවලා ඉවර උනහම මේ කෙසෙල් කඳේ මොකවත් ඉතුරුවෙන්නේ නෑ කියලා.

කිඤ්හි සියා, භික්ඛවෙ, කදලික්ඛන්ධෙ සාරො? මහණෙනි මේ කෙසෙල් කඳේ තිබෙන්නා වූ හරය කුමක්ද?

මුකුත්ම නෑ. අන්න ඒ වගේ කියලා කියනවා සංස්කාර ස්කන්ධය ගලවලා බැලුවට පස්සේ අතීත අනාගත වර්තමාන වශයෙන් ඇතුලත භාහිර වශයෙන් හොඳ නරක වශයෙන් උස් පහත් වශයෙන් ඕලාරික සූක්ෂම වශයෙන් ළඟ දුර වශයෙන් තිබෙන්නා වූ සංස්කාරයන් බලනකොට ඒකෙ කිසිම හරයක් මතුවෙන්නේ නෑ.

ඇත්තටම අපි අමුතුම විදියේ සෙවනැල්ලක ඉන්නේ. පුදුම විදියේ මායාවක ඉන්නේ. පුදුම විදියේ රැවටිල්ලක ඉන්නේ. මේ කෙසෙල් කඳේ ප්‍රයෝජනයට ගත හැකි හයිය ඇති කිසිම දෙයක් නෑ. ඒ වගේ මේ සංස්කාර ස්කන්ධයේ ගලවා ගන්න කිසිම දෙයක් නෑ. කාය සංඛාර තිබෙනවා වචී සංඛාර තිබෙනවා මනෝ සංඛාර තිබෙනවා. නමුත් ඒ කොතැනකවත් ගන්න කිසිම හරයක් නෑ. පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර හා ආනෙඤ්ඤාභිසංඛාර තිබෙනවා. නමුත් ඒ හැම එකක්ම ගලවලා ගලවලා ගත්තට පස්සේ මොකක්වත් ඉතුරු වෙන්නේ නෑ. එතකොට මේ සංස්කාර ස්කන්ධයට බුදුරාජාණන්වහන්සේ උපමාවක් හැටියට දක්වන්නේ කෙසෙල් කඳක්.

ඊළඟට බුදුරාජාණන් වහන්සේ තවත් එකක් දේශනා කරනවා.

"සෙය්‍යථාපි, භික්ඛවෙ, මායාකාරො වා මායාකාරන්තෙවාසී වා = යම්කිසි මායා කාරයෙක් (magic කාරයෙක්) හෝ එයාගේ අත්වැසියෙක්

චතුමහාපථෙ මායං විදංසෙය්‍ය = හතර මං හන්දියක විජ්ජා පෙන්නවා

තමෙනං චක්ඛුමා පුරිසො පස්සෙය්‍ය නිජ්ඣායෙය්‍ය යොනිසො උපපරික්ඛෙය්‍ය. තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායෙය්‍ය, තුච්ඡකඤ්ඤෙව ඛායෙය්‍ය, අසාරකඤ්ඤෙව ඛායෙය්‍ය = ඥානවන්ත කල්පනාව තිබෙන්නා වූ පුද්ගලයෙක් එතැනට ගිහිල්ලා මේ මායාවල් දකිනවා. ඒ පුද්ගලයා ඒ මායාවෙන් පෙන්වන දේ තුල වටිනාකමක් දකින්නේ නෑ. ඒක තේරෙන්නේ ඥානවන්තයාට පමණයි.

ඒ මායා කාරයා තිබෙනවා කියලා යම් කිසි දෙයක් පෙන්නවා ඊළඟට ඒක නෑ කියලා පෙන්නනවා. යම්කිසි දෙයක් නෑ කියලා පෙන්නවා නැවතත් ඒක තිබෙනවා කියලා පෙන්නනවා. ඉතින් මේ වැඩේ දිහා බැලුවහම ඇත්තටම මේ මැජික් වල හරයක් වටිනාකමක් ඒ ඥානවන්ත කෙනාට පෙන්නේ නෑ. මේ ගැන දන්නේ නැති කෙනා ඒක හරි ලස්සනයි කියලා රැවටෙනවා, මුලා වෙනවා.

එවමෙව ඛො, භික්ඛවෙ, යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, තං භික්ඛු පස්සති නිජ්ඣායති යොනිසො උපපරික්ඛති = ආන්න ඒ වගේ මහණෙනි යම්කිසි හිතක් යම්කිසි විඤ්ඤාණයක් අතීත අනාගත වර්තමාන හෝ වේවා ඇතුලත පිටත හෝ වේවා ඕලාරික

සුකුම හෝ වේවා හීන හෝ ප්‍රණීත වූ හෝ වේවා ළඟ දුර හෝ වේවා ඒ කියන්නා වූ විඤ්ඤාණයේ තිබෙන්නේ අමුතුම දෙයක්.

මෙන්න මෙහෙමයි ඒක බුදුරාජාණන් වහන්සේ දක්වලා තිබෙන්නේ. මනුසයෙක් එක තැනක ඉඳලා තව තැනකට යනවා. ඒ මනුස්සයා එහෙම ගියාට එයාගේ හිත තමයි එයාව ක්‍රියාත්මක කළේ. හිත පිටි පස්සේ හැංගිලා හිටියා. ඒ හිතේ බලයෙන් තමයි එයා එහෙට ගියේ. එතකොට හිත හැම වෙලේම මායාකාරයා වගේ හැංගිලා වෙන දෙයක් තමයි ඉදිරිපත් කරන්නේ.

මනුස්සයෙක් ඇවිදිනවා කියලා කියන්නේ මොකක්ද? එක තැනක ඉඳලා තවත් තැනකට යනවා. යනවා කියලා කියන්නේ මොකක්ද? යනවා කියලා කියන්නේ ඒ මනුස්සයාට ඇති වෙනවා යන්න ඕනෑ කියලා අදහසක්. ඒ යන්න ඕනෑ කියන අදහස ආවහම ඒ යන්න ඕනෑ කියන බව ක්‍රියාත්මක කිරීමක් කරනවා. එතකොට එයාගේ හිතේ තිබෙන්නා වූ චිත්ත කිරිය වායෝ ධාතුවෙන් තමයි මෙයාව ඉස්සරහට තල්ලු කරගෙන තල්ලු කරගෙන යන්නේ. එතකොට අපිට පේන්නේ රූපයයි. අපි කියනවා ඒ මනුස්සයා මෙතැන ඉඳලා අතනට ගියා කියලා. හැබැයි ඒ කඳ නොවෙයි ගියේ. හිත තමයි ඒ යෑම මෙහෙයෙව්වේ. කඳ පේනවා අපිට හිත පේන්නේ නෑ. හිත හැම වේලේම මායා කාරයා වගේ හැංගිලා. හිත හැංගිලා වෙන එකක් තමයි දර්ශනය කරන්නේ. මායා කාරයත් එහෙමයි. ඒ වගේ විඤ්ඤාණය මායා කාරයා හැටියට හැංගිලා රූපය මෙහෙයවනවා. අපි මේ කථා කරන්නෙත් හිතින්. හිත මෙහයවා මෙහයවා තමයි කථා කරන්නේ. මිනුස්සු අපේ කථාව සද්දය අහනවා. ඇත්තටම මේ සද්දය ගලපලා දෙන්නේ හිතේ මෙහෙය වීමෙන්. මේ හඬ හරි ගස්සලා දෙවන්නේ හිතේ මෙහෙය වීමෙන්. බාහිර ලෝකයාට දැනෙන්නේ මෙයා කථා කරනවා හිනහ වෙනවා කියලා. නමුත් මේ ඔක්කොම සිද්ධ කරන්නේ එහි හැංගිලා ඉන්න මායා කාරයා. ආන්න ඒක නිසා තමයි මායාවක් හැටියට විඤ්ඤාණය දැක්වූයේ.

මේ කථා කළ කාරණා පහේම තිබෙන්නේ වංචාවක් කරන්නා වූ අපිව මුලා කරන්නාවූ අපිව රවට්ටන්නාවූ ධර්ම. ඒ වගේ බුදුරාජාණන්වහන්සේ දේශනා කරනවා අපි මේ කියන්නා වූ රූපයට රැවටෙනවා. රූපය ගැන විස්වාස තියනවා. රූපය යම්කිසි කාලයක් පවතී කියලා හිතනවා. රූපයේ හැඩ වැඩ බලනවා.

ඔය විදියට තමයි තිබෙන්නේ. මේක විපස්සනාවක්. මේ විදියට ගැඹුරින් ගැඹුරින් මෙනෙහි කරකොට

"එවං පස්සං, භික්ඛවෙ = මහණෙනි මෙන්න මේ විදියට බලනකොට

සුතවා අරියසාවකො = සුතවත් වූ ආර්ය ශ්‍රාවකයා, බණ අහලා තිබෙන ආර්ය ධර්මය අහලා තිබෙන ආර්ය ශ්‍රාවකයා

රූපස්මිම්පි නිබ්බින්දති = රූපය කෙරෙහි කලකිරෙනවා, පෙණ පිඬුවක් වගේ හරයක් නැති නිසා.

වෙදනායපි නිබ්බින්දති = වේදනාව කෙරෙහි කලකිරෙනවා හරියට දිය බුබුළු වගේ නිසා.

සඤ්ඤායපි නිබ්බින්දති = සංඥාවෙත් කලකිරෙනවා ඒක මිරිඟුවක් වගේ නිසා.

සඞ්ඛාරෙසුපි නිබ්බින්දති = සංස්කාරයන් කෙරෙහි කලකිරෙනවා ඒක කෙහෙල් කඳක් වගේ වැඩක් නැති නිසා

විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති = විඤ්ඤාණයේත් කලකිරෙනවා ඒක හරියට මායා කාරයෙක් වගේ නිසා

නිබ්බින්දං විරජ්ජති = කලකිරුණට පස්සේ නොඇලෙනවා.

විරාගා විමුච්චති = ඒ පිළිබඳව ඇලෙන්නේ නැති නිසා ඒ හිත කෙලෙසුන්ගෙන් මිදී යනවා

විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති = මිදී ගියාට පස්සේ මම මේකෙන් මිදුනා කියලා නුවණක් පහළ වෙනවා.

'ඛීණා ජාති = එහෙම උනාට පස්සේ මේ ජාතිය කියන්නාවූ ස්කන්ධ පහක් හදාගෙන තවත් තැනකට එක්කාසු වීම නැති කරනවා.

වුසිතං බ්‍රහ්මචරියං = ඒ මෙනෙහි කිරීමම බ්‍රහ්ම චරියාවේ හැසිරීමක් බවට පත්වෙනවා.

කතං කරණීයං = මේ ගමන නවත්වන්න කළ යුතු සියල්ල කළා වෙනවා.

නාපරං ඉත්ථත්තායා'ති පජානාති'' = නැවත මම උපදින්නේ නෑ පහළ වෙන්නේ නෑ කියලා දැනුමක් ඥානයක් පහළ වෙනවා.

බුදුරාජාණන්වහන්සේ ස්කන්ධ පංචකය කෙරෙහි කලකිරවන්න ස්කන්ධ පංචකය පිළිබඳව එපා කරවන්න නොයෙක් බණ නොයෙක් උපමාවල් දේශනා කරනවා. මේ ගාථාව ඉතාමත් ගැඹුරු එකක්. ඒක මෙහෙම දේශනා කරනවා.

''ඵෙණපිණ්ඩූපමං රූපං	රූපය පෙණ පිඩුවකට උපමා වෙනවා
වෙදනා බුබ්බුළූපමා	වේදනාව දිය බුබුළු වලට උපමා වෙනවා
මරීචිකූපමා සඤ්ඤා	සංඥාව මිරිඟුවකට උපමා වෙනවා
සඞ්ඛාරා කදලූපමා	සංස්කාරයෝ කෙසෙල් කඳකට උපමා වෙනවා.
මායූපමඤ්ච විඤ්ඤාණං	විඤ්ඤාණය මායා කාරයෙකුට උපමා වෙනවා.
දෙසිතාදිච්චබන්ධුනා	බුදුරාජාණන්වහන්සේ මෙසේ දේශනා කරනවා.

''යථා යථා නිජ්ඣායති, යොනිසො උපපරික්ඛති;	යම් යම් ආකාරකින් නුවණින් දකිනවාද හොඳට සිතා බලනවද

රිත්තකං තුච්ඡකං හොති, යො නං පස්සති යොනිසො.	ඒ බලන බලන හැම වෙලාවකම මේකේ තිබෙන්නේ හිස් බවක් කියලා වැටෙහෙනවා.

අපි සමහර වෙලාවට සමාජයේ වැඩ කරන අවස්ථාවලදී ‘ඇයි මේක කරන්නේ’ කියලා හිතෙනවා. සමහර දේවල් යුතු කමක් හැටියට බැඳී තිබෙන දේවල් හැටියට කරනවා ඇරෙන්න ‘මොකටද මේකට යන්නේ. මොකටද මේකේ කොටසක් වෙන්නේ’ කියලා හැඟෙන අවස්ථා තිබෙනවා. එහෙම වෙන්නේ ඒකෙ වටිනා කමක් හිතට දැනේනේ නැති නිසා. ඒවගේ මේ පංච උපාදානස්කන්ධය කෙරෙහි මේ රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ පිළිබඳව ගැඹුරට ගැඹුරට මෙනෙහි කරනකොට මෙනෙහි කරනකොට අපිට ඒකෙ හිස් බවක් අමුතු විදියට දැනෙනවා.

“යො ඉමං කායං ගාරය්හං, භූරිපඤ්ඤෙන දෙසිතං; **පහානං තිණ්ණං ධම්මානං, රූපං පසෙසථ ඡඩ්ඩිතං.**	බුදුරාජාණන්වහන්සේ විසින් දේශනා කළ පරිදි ගැරහිය යුතු වූ මේ කය ධර්මතා තුනක් අයින් උනාට පස්සේ මේ කය අයින් කරන සැටි බලන්න.

“ආයු උස්මා ච විඤ්ඤාණං, යදා කායං ජහන්තිමං; **අපවිද්ධො තදා සෙති, පරභත්තං අචෙතනං.**	යම්කිසි වේලාවක මේ ජීවිතියෙන් **ආයුෂය** කියන්නා වූ ජීවිත ඉන්ද්‍රියත් **උස්මා ච** කියනා වූ කර්මජ තේජෝ වායුවත් **විඤ්ඤාණං** කියන්නාවූ හිතත් මේ කය අතහැර යනවද මේ ශරීරය එදාට කඩා වැටෙනවා. එවිට හිතක් නැති මේ කය අනිත් අයට කෑමක් වෙනවා.

ඇත්තටම අපි හැමෝම කවදාහෝ මළකඳන් බවට පත්වෙන්න ඉන්න අය. මළ කඳක් වෙන්න ඉස්සරහට ඉස්සරහට යන ශරීරයක් මේ තිබෙන්නේ.

“එතාදිසායං සන්තානො, මායායං බාලලාපිනී;	කල්පනාවක් නැති අඥානයාට නම් මේ කය හොඳ දෙයක්

වධකො එස අක්ඛාතො, සාරො එත්ථ න විජ්ජති.	බුදුරාජාණන් වහන්සේ දේශනා කරනවා මේ කය එකාන්තයෙන්ම වධකයෙක් කියලා. ඒක නිසා මේකේ කිසිම සාරයක් නෑ.

වධකයා කියලා කියන්නේ අනිත් අය නසන්නා වූ කෙනා. අපි හිතමු පඨවි ආපෝ තේජෝ වායෝ කියන රූප හතර තිබෙනවා. පඨවි නැති වෙනකොටම අනිත් ධර්මතා තුනට ඉන්න බෑ. ඒ තුනත් නැති වෙනවා. ඒ වගේ තමයි වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ කියන ධර්මතා 4 තිබෙනවා. වේදනාව නැතිවෙනකොට අනිත් ධර්මතා තුනට ඉන්න බෑ. චිත්තය නැති වෙනකොට අනිත් ධර්මතා තුනට ඉන්නත් බෑ. ඒක නිසා වධකෝ කියලා කියන්නේ ඔවුනොවුන්ට ගසා ගන්නා වූ විනාස කරන්නා වූ කෙනා.

කවුරු හරි කෙනෙක් තමන්ගේ පවුල විනාස කරනවා නම් හෝ අවබම්බුවක් අපකීර්තියක් ගේනවා නම් හෝ මහා වධකයෙක් මහා මාරයෙක් කියලා කියනවා. ඒ කියන්නේ ඒ පවුලේ අයටම විනාසයක් නින්දාවක් අපකීර්තියක් පමුණුවන නිසා. ඒවගේ මේ කියන්නා වූ ස්කන්ධ පහ ඔවුනොවුන්ටම විනාසය පමුණුවමින් තමයි ඉන්නේ. ඒක නිසා වධකයෙක් කියලා කියනවා.

"එවං ඛන්ධෙ අවෙක්ඛෙය්‍ය, භික්ඛු ආරද්ධවීරියො;	මේ අනුව ස්කන්ධයන් පිළිබඳව නුවණින් මෙනෙහි කරන්නා වූ හොඳට ආරම්භ කරනලද වීර්ය ඇති භික්ෂුව
දිවා වා යදි වා රත්තිං, සම්පජානො පටිස්සතො.	රාත්‍රී හෝ දවල් හෝ වේවා හොඳට නුවණින් මෙනෙහි කරමින් බලාගෙන සිටින විට

"ජහෙය්‍ය සබ්බසංයොගං, කරෙය්‍ය සරණත්තනො;	සියලුම සංයෝජන ධර්මයන් විනාස කරලා තමන්ට සරණක් පිහිටක් කර ගත්තාවූ කෙනෙක් බවට පත්වෙනවා.
චරෙය්‍යාදිත්තසීසොව, පත්ථයං අච්චුතං පදං"	හිස ගිනි ගත්තාවූ කෙනෙක් වගේ නිර්වාණ ධාතුව කියන්නා වූ ඒ ශාන්ත ස්ථානය පතාගෙන ඉතා ඉක්මනින් වෙර දරමින් මෙනෙහි කිරීම සිද්ධ කරනවා, මේ ස්කන්ධ ධර්මයන්ගේ අවබෝධය හදා ගන්න.

මෙන්න මේ ටික තමයි මේ සූත්‍ර දේශනාවෙන් බුදුරාජාණන් වහන්සේ කියලා දෙන්නේ. අපි මේකට අනුව තව ටිකක් සාකච්ඡා කරමු.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස පංච ස්කන්ධය ගැන කථා කිරීමේදී එකක් නැති වෙනකොට අනිත් ඒවත් නැති වෙනවා කියලා කිව්වා. ඒ කියන්නේ හැම තැනම මේ ස්කන්ධ 5 තියනවාමයි කියන එකද අදහස් කරන්නේ?

<u>පිළිතුර</u> - ඔව්, බුදුරාජාණන් වහන්සේ විශේෂයෙන්ම මේ ශරීරය ගැන සලකනවා. ශරීරය ගැන සලකනවා කියලා කියන්නේ අපි මේ ශරීරයට හරියට ගැම්මක් ලබා දෙනවා. බාහිරට මනුස්සයෙක් හැටියට ඉසේල්ලාම පේන්නේ මේ ශරීරය. මනුස්සයෙක් එක්ක කථා කරන්න යනවානම් අපි එයාගේ හිත දන්නේ නෑ. එයාගේ හිත දැනගන්න ඉස්සෙල්ලා, එයාගේ කට හඬ දැනගන්න ඉස්සෙල්ලා අපි දැක ගන්නේ එයාගේ රූපයයි. අපිට කාගෙන් හරි තොරතුරු ටිකක් දැනගන්න ඕනෙ නම් අපි ඉස්සෙල්ලාම බලන්නේ රූපස්කන්ධය එතැන තිබෙනවද කියලා. පස්සේ කථා කරනකොට තමයි අපි දන්නේ එයා හිතන්නේ කරන්නේ මොකක්ද කියලා.

ඒවගේ රූපය ගැන අපිට වැඩි සැලකිල්ලක් තිබෙනවා. අපේ රූප ගරුත්වය හරි වැඩියි. බුදුරාජාණන්වහන්සේ ආන්න ඒ කාරණය අල්ලගෙන රූපයට වෙන දේ, ඒ කියන්නේ ආයුෂය, විඤ්ඤාණය, ඌෂ්ණය කියන දේවල් රූපය වගේ පේන දේවල් නොවෙයි. **ආයු උස්මා ච විඤ්ඤාණං, යදා කායං ජහන්තිමං; අපවිද්ධො තදා සෙති** = මේ කරුණු තුන අයින් වෙච්ච ගමන් කිසිම පිහිටක් නැතුව රූපය කඩාගෙන වැටනෙවා. **සෙති** කියන්නේ වැටනෙවා. **පරභත්තං අචෙතනං** = අනිත් සත්තුන්ට ආහාර වෙනවා. දැනටමත් අපේ ශරීරයේ සත්තු ගොඩක් ඉන්නවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මේ සංස්කාර ස්කන්ධය කියන එක අපි දැනට ලබා ගත් අත්දැකීමද? පිං හරි පව් හරි රූප හරි මොනවා හරි අපි හඳුනා ගන්න දේවල් කොහේ හරි තැන්පත් වෙලා තිබුනොත් විතරද අපිට ඒ ගැන මෙනෙහි කරන්න හරි නැවත හිතන්න හරි පුළුවන් වෙන්නේ?

<u>පිළිතුර</u> - දැනගත්ත දේවල් යන්නේ සංඥාවට. සංස්කාර කියන තැන තිබෙන මූලිකම ධර්මය තමයි චේතනාව. අපි හිතලා බැලුවොත් ඇයි බුදුරාජාණන් වහන්සේ සංස්කාර ස්කන්ධය විස්තර කිරීම සඳහා කෙසෙල් කඳක් ගත්තේ වෙන දෙයක් ගන්නේ නැතුව කියලා, කෙසෙල් කඳේ පොතු ගලවාගෙන ගලවාගෙන ගලවාගෙන යනවා. එහි කිසි හරයක් හමුවෙන්නේ නෑ.

සංස්කාර ස්කන්ධය කථා කරන්න ආකාර කීපයක් තිබෙනවා. 'කාය සංඛාර' 'වචී සංඛාර' 'මනෝ සංඛාර' කියලා කථා කරනවා. ඊළඟට තිබෙනවා 'පුඤ්ඤාභි සංඛාර' 'අපුඤ්ඤාභි සංඛාර' හා 'අනෙඤ්ජාභි සංඛාර' කියලා කථා කරනවා. දැන් මෙතැනම සංඛාර හයක් උනා. මේ හය පැත්තෙන් ගත්තත් කිසිම හරයක් නෑ. අනිත් එක තමයි සංඛාර සකන්ධයට

චෛතසික ධර්ම 50 අයිතියි. ඔක්කොම චෛතසික ධර්ම 52 න් වේදනා චෛතසිකයයි සංඥා චෛතසිකයයි දෙක අයින් කරන්න ඕනෑ. එතකොට 50 ක් ඉතුරුයි. ඒ 50 චේතනා චෛතසිකයත් එක්කයි. චේතනා චෛතසිකය අයින් උනහම 49යි. මේ චෛතසික 50 ප්‍රධානම එක්කෙනා තමයි චේතනා චෛතසිකය. චේතනා චෛතසික තමයි සංස්කාර කෙරුවාව කරන්නේ. හැබැයි මේ වැඩේට අනිත් චෛතසික ධර්ම 49 තුල තිබෙන ලෝභය ද්වේශය මෝහය උදව් කරනවා. අලෝභය අද්වේසය අමෝහය උදව් කරනවා. චේතනාව කියන එක අනිත් අයත් ඔක්කොම manage කරගෙන තමයි ඔය වැඩේ කරන්නේ. ඒක නිසා සංස්කාර ස්කන්ධයට ධර්ම 50 තිබෙනවා. ඔය 50හම ගලවලා ගලවලා බැලුවත් හරයක් නෑ.

'කාය සංඛාර' 'වචී සංඛාර' 'මනෝ සංඛාර' හැටිය බැලුවත් හරයක් නෑ. 'පුඤ්ඤාභි සංඛාර' 'අපුඤ්ඤාභි සංඛාර' හා 'අනෙඤ්ජාභි සංඛාර' හැටියට බැලුවත් හරයක් නෑ. අනිත් එක චෛතසික හැටියට බැලුවත් කිසිම හරයක් නෑ කියලා තමයි කියන්න තිබෙන්නේ. සංස්ඛාර කියලා කියන්නේ රැස් වෙන ආකරයට.

තවත් එකක් තිබෙනවා සංස්කාර ගැන කථා කරනකොට. මේක හොඳට මතක තබා ගන්න. සංස්කාර ධර්ම රැස්වෙන ස්ථානයේ හැටියටත් නම් කරනවා. සමහර වෙලාවට හැදිච්ච සංස්කාරයේ තිබෙන්නාවූ ස්වභාවයේ හැටියටත් නම් කරනවා.

මම මේකට මේවගේ උදාහරණයක් කිව්වා. පලතුරු නම් කරනකොට ඒවා හැදිච්ච ගහේ හැටියටත් නම් කරනවා. අඹ ගහෙන් ආවනම් අඹ ගෙඩි කියනවා දොඩම් ගහෙන් ආවනම් දොඩම් ගෙඩි කියනවා. පේර ගහෙන් ආවනම් පේර ගෙඩි කියනවා. එතකොට ගහේ නමත් එක්ක තමයි අඹ ගෙඩිය දොඩම් ගෙඩිය කියලා කියන්නේ. හැබැයි සමහර වෙලාවට ඒ ගෙඩියේ තිබෙන ගුණය සලකාගෙනත් නම් කරනවා. අපි කියනවා 'ඕවා ඇඹුල් ගෙඩි' 'ඕවා හරි ගුණ ගෙඩි' කියලා කියනවා. එතකොට ගහ ගැන කථාවක් මොකක්වත් නෑ. ඒවගේ 'කාය සංඛාර' 'වචී සංඛාර' 'මනෝ සංඛාර' ගැන කිව්වහම ගහ ගැන කිව්වා වගේ. 'පුඤ්ඤාභි සංඛාර' 'අපුඤ්ඤාභි සංඛාර' හා 'අනෙඤ්ජාභි සංඛාර' ගැන කියන කොට දොරටු මුකුත් නෑ. එතකොට ඒවා හැදෙන quality ඒකෙ හැටියට තමයි නම් කරන්නේ.

ඔය විදියට සමහර විට ඵලය මුල් කරගෙන නම් දෙනවා. සමහර වෙලාවට ආශ්‍රය නිශ්‍රය ධර්මය මුල් කරගෙන නම් දෙනවා. දැන් අපි කෑම ගැන කියනකොටත් එහෙම තමයි කියන්නේ. එක්කෙනෙක් අපිට පාන් ගේනවා. පාන් ගේනකොට සමහර වෙලාවට එයා කියන්නේ බේකරියේ නම. සමහර වෙලාවට එයා බේකරියේ නම කියන්නේ නැතුව පුඤ්ඤාභි සංඛාර, අපුඤ්ඤාභි සංඛාර හා අනෙඤ්ජාභි සංඛාර කියන්න වගේ grains mixed පාන් කියනවා nuts mixed පාන් කියනවා wholemeal පාන් කියනවා. එතකොට බේකරි කථාවක් නෑ. අන්න ඒවගේ තමයි ඔය ආකාර දෙක. සංස්කාරයෝ නම් කරන්නේ උප්පත්ති ස්ථානය අනුව සහ ඒකෙ quality අනුව.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දැන් මේ දේශනාව පටන් ගත්තේ ඇස් ඇති මිනිහෙක් කියලා.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඇස් ඇති කියලා කියන්නේ මහත්තයා කල්පනාව තිබෙන කෙනෙක්. එහෙම නැත්නම් කෙනෙකුට කියන්න පුළුවන් 'මමත් බැලුවා මම දැක්කේ නෑ' කියලා. **චක්ඛුමා පුරිසො** කියලා කියන්නේ ඥානය තිබෙන කෙනෙක්. ධර්මක්ඥානය තිබෙන්න ඕනෑ, යෝනිසෝ මනසිකාරය සිහිය කල්පනවා තිබෙන්න ඕනෑ. එහෙම නැති අයට ඕක තේරෙන්නේ නෑ.

බුදුරාජාණන් වහන්සේ එතනිනුත් කියන්නේ මේ ධර්මය **පඤ්ඤාවන්තස්සායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස** කියලා. මේ ධර්මය ප්‍රඥා වන්තයාටයි. ඥාන වන්තයාට පමණයි මේ ධර්මය මෙහෙම බලන්න පුළුවන් කම තිබෙන්නේ කියලා.

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස මම ඒකෙන් අදහස් කළේ දැන් ඒ සූත්‍රයේ මුලින් කියලා තිබෙන්නේ ඇහැට පේන දේවල් නිසා. පෙණ පිඩුවත් ඇහැට පේන එකක් දිය බුබුලත් ඇහැට පේන එකක්. ඒවගේ උපමා ගත්තු ඒවා ඇස් වලට පේනවා. අපි හිතමු ඇස් නැති කන් පමණක් තිබෙන කෙනෙකුට ධර්මය අවබෝධ කරගන්න පුළුවන් කියලා කියනවානේ.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒ අර්ථයෙන් නොවෙයි මහත්තයා. ඇස් ඇති පුරුෂයෙක් බලනවා කියලා කියන්නේ පෙන්නේ ඇස් ඇති මනුස්සයාට නිසා. දැන් මෙතැන කරුණු 5ක් කිව්වා. පෙණ බුබුල කියන එක ඇස් පෙන්නේ නැත්නම් පේන්නේ නෑ. දිය බුබුල ඇස් පේන්නේ නැත්නම් පේන්නේ නෑ. මිරිඟුව ඇස් පේන්නේ නැත්නම් පේන්නේ නෑ. කෙසෙල් කඳ ඇස් පේන්නේ නැත්නම් පේන්නේ නෑ. මායාව ඇස් පේන්නේ නැත්නම් පේන්නේ නෑ. එතකොට ඇස් පේන්නේ නැති එක්කෙනාට මේ පහම පේන්නේ නෑ. එතකොට 'මේකෙන් වැඩක් නෑ සාරයක් නෑ' කියලා පේන්න ඇස් තිබෙන්න ඕනෑ. ඒක බුදුරාජාණන් වහන්සේ අනිත් පැත්තට යොදන්නේ ස්කන්ධ පහේ තිබෙන්නා වූ අසාරත්වය තුච්ඡ බව තේරෙන්නේ ප්‍රඥාව කියන්නා වූ ඇස තිබුණොත් පමණයි. නැත්නම් ඒ මනුස්සයාට උපමා පහේම තිබෙන්නා වූ විවිධත්වය වෙනස් කම තේරෙන්නේ මසැස තිබුණ නිසා. යම් කිසි කෙනෙකුට මේ ශරීරයේ තිබෙන අසාරත්වය නිස්සාරත්වය තේරෙන්නේ ප්‍රඥාව කියන්නා වූ ඇස තිබුනොත් පමණයි. නැත්නම් තේරෙන්නේ නෑ.

<u>මහත්මියක්</u> - ස්වාමීන්වහන්ස සමහර තැන් වල තිබෙනවා මේ ධර්මය දේශනා කරන්නේ දන්න කෙනාටයි දකින කෙනාටයි කියලත්. එතැනත් කියන්නේ ප්‍රඥාව ගැන නේද ස්වාමීන්වහන්ස?

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව් එතැනත් කියන්නේ **පඤ්ඤාවන්තස්සායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස** = මේ ධර්මය ඥානවන්තයන්ටයි, ප්‍රඥාවන්තයන්ටයි ඥානය නැති කෙනාට නොවෙයි කියලා. දකින්නාවූ කෙනාට කියලා කියන්නේ ඒකයි.

<u>මහත්මියක්</u> - ස්වාමීන්වහන්ස බුදුහාමුදුරුවන්ගේ කාලයේ හිටපු සුනීත සෝපාක වගේ අයටත් ධර්මය අවබෝධ කරගන්න පින තිබිලා තියෙනවා නේද ස්වාමීන්වහන්ස.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව්, සංසාරයේ රැස් කරපු පිං තිබිලා තියෙනවා.

නමුත් සමහර අය බුදුරාජාණන් වහන්සේ ළඟ ඉඳලත් වෙන වෙන තීර්ථක ආරාම වලට ගියා. ඒ ගොල්ලන්ට ධර්මය අහු උනේ නෑ. හොඳට මහණ වෙලා උපසම්පදා වෙලා ඉඳලා මේක වැඩක් නෑ කියලා ගියා. බුදුරාජාණන්වහන්ස්ගේ සාසනයේම මහණ වෙලා ඒකෙම ඉඳගෙන ඒකෙම පිණ්ඩපාතේ වළඳලා බුදුරාජාණන්වහන්සේ පිටි පස්සෙන්මත් ගිහිල්ලා ඒ group ඒකෙ ඉඳගෙන ඒ හම්බවෙන දානය වළඳලා බුදුරාජාණන් වහන්සේට ගරු කරන්නේ නැතුව වෙන වෙන නිගණ්ඨයන්ට වැඳපු ගරු කරපු අය හිටියා. අර එක සූත්‍රයක තිබෙනවා රජගහනුවර ඉඳලා නාලන්දාවට ගුරෙකුයි ගෝලයෙකුයි බැණ බැණ යනවා.

ඊට පස්සේ බුදුරාජාණන්වහන්සේ දේශනා කළා එහෙම තීර්ථක ආරම වලට ගිහිල්ලා ආපහු එන අය භාර ගන්න එපා ඒ අයට මේ සාසනයේ සරණක් නෑ කියලා. මේ කාලයේ උනත් බෞද්ධයෝ හැටියට ඉඳලා සිවුරු ඇරලා වෙන වෙන තැන් වලට ගිහිල්ලා ආයෙත් අවොත් මහණ කරන්න එපා එයා අකැප කෙනෙක් කියලා සලකලා තිබෙන්නේ.

බුදුරාජාණන් වහන්සේ දේශනා කරලා තිබෙනවා බුදුරාජාණන්වහන්සේ ප්‍රතික්ෂේප කරලා ගිය කෙනාට ආයෙත් සරණක් ගන්න බෑ කියලා. බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නය ප්‍රතික්ෂේප කරලා ඒ අය යන්නේ. ඒ සරණ ආපහු ගන්න බෑ ඒ අයට මේ ජීවිතියේ. එයාට පන්සිල් සමාදන් වෙලා ගිහියෙක් හැටියට ඉන්න පුළුවන්.

බුදුරාජාණන් වහන්සේ එකොළොස් දෙනෙක් මහණ කරන්න තහනම් කළා. සමහර අයගේ මෙහෙම තිබෙනවා. එයාට මහණ කම හිටිනවා නමුත් මහණ කරපු හාමුදුරුවන්ට හොඳ නෑ. ඔක්කොම ඉන්නවා 43 දෙනෙක්. එයින් 11 දෙනෙක් ඉන්නවා මහණ කරන්නම එපා මේ බුද්ධ සාසනයේ ඒ අයට පිහිටක් නෑ ඒ අයට මේකෙන් අවැඩක්මයි වෙන්නේ කියලා කිව්ව අය.

ඒ අය තමයි

- **පණ්ඩකයෝ** - ඒ අය නපුංසකයි. ඒ අයට මේ බුද්ධ සාසනයේ මහණ වෙලා වැඩක් කරන්න බෑ.

- **උභතෝ බ්‍යඤ්ජනක** - ඒ කියන්නේ ස්ත්‍රී ස්වභාවය සහ පුරුෂ ස්වභාවය දෙකම තිබෙනවා.

- **තිත්ථිය පක්කන්තක** - බුද්ධ සාසනය අතහැරලා තීර්ථක ආරාමවලට ගිය අය.

- **තිරච්ඡානගත** - ඒ කියන්නේ තිරිසන් අය. මිනිස් වෙස් අරගෙන නාගයෝ එහෙම මහණ වෙන්න එනවා කියලා කියනවා. ඒ අයටත් මේ බුද්ධ සාසනයේ මුකුත්ම කරගන්න බෑ.

- **ථෙය්‍ය සංවාසකයා -** ඒ කියන්නේ බුද්ධ සාසනයේ නියම විදියට ගුරුවරයෙක් යටතේ මහණ වෙන්න කලින් තමන් සිවුරු පොරවාගෙන මහණ වෙච්ච එක්කෙනා. ථෙය්‍ය සංවාසකයා හොරට මහණ වෙලා අනිත් භික්ෂූන් වහන්සේලා සමග එකට ගැවසෙනවා. මේ අය හොරට ඉන්න බව දැන ගත්ත ගමන්ම සිවුර ගලවලා පිටත් කරන්න කියලා තියෙනවා.

- **භික්ෂුණී දූෂකයා**
- **මාතෘඝාතකයා**
- **පිතෘඝාතකයා**
- **අරහන්ත ඝාතකයා**
- **ලෝහිතුප්පාදකයා**
- සංඝභේදකයා

යන මේ එකොළොස් දෙනාටම මේ බුද්ධ සාසනයේ සරණක් පිහිටක් නෑ. අපි හිතමු පසු කාලීනව අජාසත්ත රජතුමා මහණ වෙන්න කැමති උනා කියලා. ඒ උනාට මහණ කරන්න බෑ. කර්මාවරණය තිබෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස විදර්ශනා කරන කොට ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො කියලා බලන්න කියනවනේ ස්වාමීන්වහන්ස. ඒක පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න.

<u>පිළිතුර</u> - 'ඉති රූපං' කියලා කියන්නේ රූපය මේ ආකාරයි, රූපය මේ විදියයි කියල සලකා ගන්නවා. හේතු ප්‍රත්‍යය බැලීම් වශයෙන් හෝ ඇතිවීම නැතිවීම වශයෙන් බලනවා. රූපය ඇතිවෙනවා නැති වෙනවා කියලා බලනවා. කර්මයෙන් හටගන්නා රූප තිබෙනවා. හිතෙන් හටගන්නා රූප තිබෙනවා. ඔය වගේ රූපදිහා බලනවා.

ඊළඟට 'ඉති රූපස්ස සමුදයො' කියන කොට 'මේ හේතු නිසයි රූපය ඇතිවෙන්නේ' කියලා බලනවා. 'ඉති රූපස්ස අත්ථඞ්ගමො' කියනකොට මේ හේතු නැතිවෙනකොට රූපය නැතිවෙනවා කියලා බලනවා.

අපේ මේ ශරීරය රූපයක්. මේ රූපය පවතින්නේ කරුණු කීපයක් මත. එකක් තමයි ආහාර ප්‍රත්‍යය. කබලීකාර ආහාරයේ ප්‍රත්‍යය ලබමින් මේ රූපය පවතිනවා. ඒක නිසා අල්ලාගෙන යනවා. කබලීකාර ආහාරය නවත්තපු ගමන්ම මේ ශරීරය වැටෙනවා. කර්මජ තේජෝ ධාතුවක් තිබෙනවා. ඒ කර්මජ තේජෝ ධාතුව පවතින්නත් ආහාර ප්‍රත්‍යය අවශ්‍යයයි. කර්මජ තේජෝ ධාතුවත් ජීවිත ඉන්ද්‍රිය ආදී දේවල් නැති උනගමන්මත් මේක පවත්වන්න බැරි වෙනවා. විඤ්ඤාණය අයින් උන ගමන්මත් මේක පවත්වන්නත් බැරි වෙනවා.

විඤ්ඤාණයට පවතින්න ස්පර්ශයත් අවශ්‍යයි. සංඥාවටත් ස්පර්ශය අවශ්‍යයි. වේදනාවටත් ස්පර්ශය අවශ්‍යයයි. මේ තුනටම ස්පර්ශ ධර්ම අවශ්‍යයි. රූපයට ආහාර අවශ්‍යයි. අපේ ජීවිතිය හැදිලා තිබෙන්නේ 'අවිද්‍යා' 'තණ්හා' 'කර්ම' සහ 'ආහාර' ප්‍රත්‍යයෙන්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන් නිබ්බත්ති ලක්ෂණයත් එක හේතුවක්ද?

<u>පිළිතුර</u> - නිබ්බත්ති ලක්ෂණය කියන්නේ හට ගැනීම. උදය වය බලන තැන පෙනෙන විදි කීපයක් තිබෙනවා. ඒ පෙනෙන විදි කීපයකින් එකක් තමයි ඔය නිබ්බත්ති ලක්ෂණය.

<u>ප්‍රශ්නය</u> - නිබ්බත්ති ලක්ෂණය සංසාර පැවැත්මට උදව්වෙන අවිද්‍යා තණ්හා කර්ම සහ ආහාර ඇතුලේ තිබෙන එකක්ද වෙනම එකක්ද?

<u>පිළිතුර</u> - නෑ, නිබ්බත්ති ලක්ෂණය කියන්නේ හට ගැනීමේ ලක්ෂණ මාත්‍රයමයි. උදාහරණයක් හැටියට කිව්වොත් අපි පස්දෙනෙකුට කියනවා විදර්ශනා භාවනා කරන්න කියලා. ඒ පස් දෙනා විදර්ශනා භාවනා කරමින් යනවා. ඒ අය ඇතිවීම නැතිවීම බලනවා.

ඒ පස් දෙනාගෙන් එක්කෙනෙක් යමක් ඇති වෙන්නේ මේ ප්‍රත්‍යයෙන් කියලා ඒ ප්‍රත්‍යය දකිනවා. ඒ වෙලාවට උපදින කථාව නොවෙයි මේ කියන්නේ. මේක හට ගන්නේ ප්‍රත්‍යයයෙන්, ප්‍රත්‍යය හැදුනොත් තමයි මේක හටගන්නේ කියලා ප්‍රත්‍යය ගලපලා බලනවා. ඒකත් ඇති වීම නැති වීම බැලීමක්. ඒ කියන්නේ අවිද්‍යාව නිසා තමයි මේක හටගන්නේ කියලා එකක් බලනවා.

එතැන ඉන්න තව එක්කෙනෙක් බලනවා තණ්හා කරපු නිසයි මේක හටගත්තේ කියලා තණ්හාවෙන් ඇති වෙච්ච එකක් හැටියට බලනවා. මේකෙන් කියන්නේ ඇස ඒ වෙලාවේ හටගත්ත කථාව නොවෙයි. ඒක හැදෙන්න පිටි පස්සේ තිබ්ච්ච ප්‍රත්‍යය බැලීමයි එයා කළේ.

අනිත් එක්කෙනා බලනවා මේ රූපය හැදෙන්න කර්මයත් බලපාල තිබෙනවා කියලා. කර්ම ප්‍රත්‍යයෙන් මේ රූපය හැදුනා කියලයි මෙයා බලන්නේ.

තව එක්කෙනෙක් දකිනවා මේක හැදෙන්නේ ආහාර නිසා කියලා.

මේ හතර දෙනාම දකින්නේ ඇත්ත වශයෙන්ම එකක් හැදෙන්න තිබෙන්නා වූ ප්‍රත්‍යය ටිකක්. ඔය හැම එක්කෙනාටම හතරම තිබෙනවා. හැබැයි ඒ එක්කෙනෙකුට පේන්නේ එකයි. අනිත් තුන්දෙනාටත් තිබෙනවා ඒ ගතිය.

නමුත් පස්වෙනි එක්කෙනා ප්‍රත්‍යය වශයෙන් බලන්නේ නෑ. එයා බලන්නේ ඇතිවීමේ ගතිය. ඇතිවීමේ ගුණය. ඒ වෙලාවට එයා ප්‍රත්‍යය බලන්නේ නැහැ. ඒ ඒ මොහෙතේ ඇතිවීමේ ලක්ෂණය බලනවට කියනවා නිබ්බත්ති ලක්ෂණය බලනවා කියලා. හිත හරි රූපය හරි වේදනාව හරි මොකක් හෝ ධර්මයක ඇතිවීම එයා දකිනවා.

- අපි හිතමු මට ඇතිවෙනවා වේදනාවක්. මේ වේදනාව ඇති වෙන්න අවිද්‍යාව හේතුවෙලා තිබෙනවා.

- නැවතත් හිතනවා මම මේකට ආසා කරලා තිබෙනවා කියලා. ඒ කියන්නේ තණ්හාව නිසා වේදනාව ඇති උනා කියලා.

- නැවතත් මම හිතනවා මේ වේදනාව හැදෙන්න කර්මයක් කරලා තිබෙනවා, ඒක නිසා ඇති වේදනාව උනා කියලා.

- අනිත් එක තමයි වේදනාවේ පැවැත්මට ආහාර ප්‍රත්‍යයත් බලපානවා කියලා.

- තවත් විදියක් තිබෙනවා. එහෙම ප්‍රත්‍යය බලන්නේ නැතුව 'වේදනාව ඇති වෙනවා' 'නැති වෙනවා' කියලා බලනවා. එහෙම වේදනාවේ ඇතිවීම බලනවට කියනවා **නිබ්බත්ති ලක්ෂණය** බලනවා කියලා.

<u>ප්‍රශ්නය</u> - දැන් ඔය බැලීම් ක්‍රම පහම විදර්ශනාද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඔව් මෙහෙමයි ඕක තිබෙන්නේ. කරුණු හතරක් ගැන ප්‍රත්‍යය බලනවා නම් අපි හිතමු එක මනුස්සයෙක් විශාල බරක් රෝද තිබෙන wheelbarrow එකක හරි කරත්තයක හරි දාගෙන ඇදගෙන යනවා. එක්කෙනෙක් ඉස්සරහෙන් අදිනවා ලණුවක් දාලා. තව දෙන්නෙක් පිටි පස්සෙන් තල්ලු කරනවා. එතකොට ඒ බර යන්නේ අදින එක්කෙනා නිසාත් තල්ලු කරන දෙන්නා නිසාත්. දෙන්නෙක් තල්ලු කරපු හින්දම නොවෙයි. දැන් මේ බර ඉස්සරහට යන්න කී දෙනෙකුගේ හයිය ඕනේද? තුන් දෙනෙක් ඕනේ. අදින එක්කෙනා හින්දත් තල්ලු කරන දෙන්නා හින්දත් ඒක යනවා. එතකොට තල්ලු කරන එක්කෙනෙකුගේ ශක්තිය මදි. දෙන්නම තල්ලු කරන්න ඕනේ. දෙන්නාගේ ශක්තිය ඒකට එකතු වෙලා තිබෙනවා. අදින එක්කෙනාගේ ශක්තියත් එකතු වෙනවා. ඒ තුදෙනාගේම ශක්තිය එකතු උනාට පස්සේ තමයි එක වෙලාවේම තල්ලු වෙන්නේ. ඊළඟට මේ කරත්තයක කොහේ හරි නවත්වලා තිබෙනවා. ඒකට අඩ තියලා තුන්දෙනාම අයින් වෙනවා. ඒක නවත්වා ගත්තේ අඩයක් තියලා. ඒ අඩය තිබ්බ ගමන් දැන් අර තුන්දෙනාගේ ශක්තිය අවශ්‍ය නෑ. මේක අවස්ථා දෙකක්.

ආන්න ඒ වගේ තමයි අවිද්‍යාවයි තණ්හාවයි දෙක එක වෙලාවේ තල්ලුව දානවා. කර්මය කියන එක ඒ වේලාවේම අදිනවා. අවිද්‍යාවයි තණ්හාවයි දෙන්නා පිටි පස්සෙන් එකම වේලාවේ තල්ලු කරනවා, කර්මය කියන එක ඒ වේලාවේම අදිනවා. ඒ තුන්දෙනාම හින්ද තමයි මේක යන්නේ. දැන් ඕක ගිහිල්ලා නවත්වනවා කොහේ හරි. දැන් මේ තුදෙනාම දක්කාගෙන ආපු එක තමයි නවත්වලා තිබෙන්නේ. ඒ නවත්වලා තිබෙන වේලාවේ support එකක් තිබෙනවා ඒක රැදෙන්න. ඒ වගේ තමයි අපි මීට ඉස්සර වෙලා ජීවිතියේදී තණ්හාවෙයි අවිද්‍යාවෙයි ප්‍රත්‍යය ලබාගෙන කර්ම කරලා තිබෙනවා. ඒක නිසා අවිද්‍යාවයි තණ්හාවයි දෙක support කළා. කර්මය කර්ම කළා. මේ තුන්දෙනා

එකතුවෙලා දක්කාගෙන ආපු එක තමයි මේ ජීවිතිය. ඒ තුන්දෙනා දක්කාගෙන ආපු එක දැන් නවත්වලා තිබෙනවා. ඒකට තියපු අඩය වගේ තමයි දැන් මේ කෑම දිදී රැක ගන්න එක. ඒකට කියනවා වර්තමාන අඩය නැත්නම් වර්තමාන උපස්තම්භනය කියලා. කෑම දිදී මේකට අඩ ගහන්න අනිත් තුන්දෙනා වැඩේ කරලා තිබෙන්නේ. ඔන්න ඔය විදියටයි ඕක තිබෙන්නේ.

දැනුත් කරන්නේ ඒකමයි. මෙහෙන් අවිද්‍යාවයි තණ්හාවයි තල්ලුව දානවා. කර්මය අදිනවා. ඊට පස්සේ එහා තැනට ගියාට පස්සේ ඒකට කෑම දිදී අඩ තියනවා. ඇත්තටම අපි මේ ඇස් කන් නාස් දිව ශරීරය, මේ සියල්ල හදලා තියෙන්නේ තණ්හාවෙයි අවිද්‍යාවෙයි උපකාරය ලබාගෙන. කර්මයටම බෑ මේ වැඩේ කරන්න.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි වෙන භවයකට යනකොට මේ ටික බලපානවා වගේ එක හිතක ඉදන් තව හිතකට යනකොටත් ඒ විදියමද වෙන්නේ? හිත වෙනස් වේවි වේවි යනවා. නමුත් මේ හිතේ යම්කිසි දෙයක් ලබාගෙන තමයි ඊළඟ හිත පහළ වෙන්නේ. එතකොට මේ ධර්මතා හතරම ඊළඟ හිතට බලපානවද?

<u>පිළිතුර</u> - ඔව්, හැබැයි හැම හිතකටම ගලපන්න බෑ. 'කර්ම හිතයි' 'විපාක හිතයි' කියලා දෙකක් තිබෙනවා. කර්ම හිතේ වැඩ කරන විදියයි විපාක හිතේ වැඩ කරන විදියයි වෙනස්. විපාක කියන්නේ පෙර කරපු කර්මයක බලය තමයි මෙතැන විපාකයක් හැටියට ඉදිරිපත් වෙන්නේ. ඒක ගහයි ගෙඩියයි වගේ. විපාකය මතුවෙන්නේම පෙර කරපු කර්මයක ප්‍රතිපලයක් හැටියට. ගෙඩිය තිබෙන්නේ ගහේ.

<u>මහත්මයෙක්</u> - ඔබ වහන්සේ දේශනා කරලා තිබෙනවා අපිට පංච ඉන්ද්‍රියන්ට ගෝචර වෙන හැම එකක්ම විපාකයක්මයි කියලා.

<u>පිළිතුර</u> - ඔව්, මේ කාරණය අපි ගැඹුරින් කථා කරනවා නම් මෙහෙමයි තිබෙන්නේ. අපි හිතමු අපි කැළණි විහාරයට යනවා. ඒ විහාරය අපි හදපු එකක් නොවෙයි. ඒක මේ වෙන මිනුස්සු සල්ලි දීල හදපු එකක්. හැබැයි අපි එතැනට ගියාට පස්සේ අපිට චක්ඛු විඤ්ඤාණයක් පහළ වෙනවා. අපිට හම්බවෙන ඒ චක්ඛු විඤ්ඤාණය කුසල විපාකයි. ඒ කුසල විපාක චක්ඛු විඤ්ඤාණය හදන්න උපකාර වෙන්නා වූ විහාරය අපේ යම් කිසි කර්ම හේතුවෙන් සෘතු සමුට්ඨාන රූප සම්භාරයක් වශයෙන් තමයි අපිට ඒ වේලාවේදී විපාක හැටියට ඉදිරිපත් වෙන්නේ. ඒක හින්දා ඒ විහාරය කියන එක මටත් තවත් විසාල පිරිසකටත් කුසල විපාක චක්ඛු විඤ්ඤාණ පහළ කරගන්න උපකාර වේවී පිහිටන්නා වූ වස්තුවක්. නිවනත් ඒ වගේ. අපි මේවා තනි කරලා ගන්නවා. අපි හිතනවා මේක මගේ කරුමයක්, කොහොමද එයාගේ කරුමයක් වෙන්නේ කියලා. එහෙම නෑ, ඒක මගේ කර්මයකුත් වෙනවා. අනිත් එක්කෙනාගේ කර්මයකුත් වෙනවා.

අඹ ගහක් තිබෙනවා. අඹ ගහේ ගෙඩි හැදෙනවා. මමත් කනවා, බඩ පුරවා ගන්නවා. තවත් එක්කෙනෙකුත් කනවා. බඩ පුරවා ගන්නවා. කුරුල්ලොත් කනවා, බඩ පුරවා ගන්නවා. එතකොට විසාල පිරිසකගේ බඩ පුරවා ගන්න එකම අඹ ගහ හේතුවෙනවා. ඒ වගේ තමයි

සමහර ඒවා පොදු වශයෙන් විසාල පිරිසකට විපාක දෙවන්නා වූ වස්තු. දැන් බලන්න අනුරාධපුර රුවන්වැලිසෑය චෛත්‍යය හැදුවේ දුටුගැමුණු රජ්ජුරුවෝ. ඒ උනාට දුටුගැමුණු රජ්ජුරුවන්ට විතරක් නොවෙයි කුසල විපාක චක්ඛු විඤ්ඤාණ පහළ උනේ. අපි බලන හැම වාරයකම අපිට එන්නෙත් කුසල විපාක චක්ඛු විඤ්ඤාණ. අපිත් කුසලයක් කරලා තිබෙනවා ඒක දකින්න. ඒ වෙලාවට අපේ පිනකින් තමයි ඒක තිබෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ කියන පහෙන් සංඥාව නැතුව අනිත් හතර තිබෙන්න පුළුවන් නේද ස්වාමීන්වහන්ස? මම දැකපු කෙනෙක් ගැන මේ වෙලාවේ මතක් උනා. එයා අම්මා හඳුන්නන්නෙත් නෑ. තාත්තා අඳුරන්නෙත් නෑ. දෙන ආහාරය ගැන දන්නෙත් නෑ. නමුත් මනුස්සයෙක් හැටියට ජීවත් වෙනවා.

<u>පිළිතුර</u> - සංඥාව කියලා කියන්නේ හඳුනාගැනීමයි කියන අර්ථ කථනයත් සමග විස්තර කරන්න යාමේදී තමයි ඔය විදියට වෙන්නේ. සිංහල භාෂාවේ සංඥාව කියන එකට දීලා තිබෙන අර්ථ කථන මිනුස්සුන්ගේ හිත් වල තදබල විදියට එරිලා කෙටිලා හරියට යටගිහිල්ලා තිබෙන නිසා නියම අර්ථය ගන්වන්න හරි අමාරුයි. අපි සාමාන්‍යයෙන් හඳුනා ගැනීම කියලා තමයි කියන්නේ. ඒකත් හඳුනා ගැනීමක් තමයි හැබැයි අපි කියන හඳුනා ගැනීමම නොවෙයි.

දැන් අපි හිතමු කෙනෙකුට තේරෙන්නේ නෑ කියලා. එයාට අම්මාද තාත්තද කියල තේරෙන්නෙත් නැති උනාට එයාට සද්දයක් අහුනහම එයා කෑගහනවා. එහෙනම් එයාට සද්ද සංඥාව තිබෙනවා. එයා කෙනිත්තුවහම අත ගන්නවා නම් එයාට ඒක තේරෙනවා. සංඥාවක් තිබෙනවා. කවදාකවත්ම හිතක් සංඥාවක් නැතුව පහළ වෙන්නේ නෑ. බලන්න, සර්ව චිත්ත සාධාරණ චෛතසික හතක් තිබෙනවා. ඵස්ස වේදනා සංඥා චේතනා ඒකග්‍රතා ජීවිතේන්ද්‍රිය මනසිකාරය කියලා. මේ චෛතසික හත හැම හිතකම තිබෙනවා.

අපි මෙහෙම කියනවා. අපි වැඩිය ලුණු දාන්නෙත් නැතුව මිරිස් දාන්නෙත් නැතුව යන්තම් දාල කෑමක් හදනවා. ඊට පස්සේ අපි කියනවා ඒ කෑම කිසිම රහක් නෑ කියලා. ඒකට හේතුව අපිට හුරු වෙච්ච ලුණු රහයි ඇඹුල් රහයි මිරිස් රහයි නැති හින්දා. නමුත් ඒ කෑමෙත් යම් කිසි රහක් තිබෙනවා. නමුත් ඒ රහ කෑමකදී අපි හොයන, අපි අර්ථ ගන්වන රස නොවෙයි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස බුදුරාජාණන්වහන්සේ දස සහස්ශ්‍රී ලෝකධාතුවක් තිබෙනවා කියලා දේශනා කළා. බුදුහාමුදුරුවෝ ඒ දකින්නේ ඇත්තටම ඒ මොහොතේ තිබෙන දේවල්ද? නැත්නම් හිතේ තැන්පත් වෙලා තිබෙන දෙයක්ද?

<u>පිළිතුර</u> - බුදුරාජාණන් වහන්සේ ඉස්සෙල්ලත් දැකලා තිබෙනවා. ඒ වේලාවේත් දකිනවා. බුදුරාජාණන් වහන්සේ තිබෙන දේවල් සියල්ලම දැන ගත්තා. බුදුරජාණන්වහන්සේ මහා කරුණා සමාපත්ති ඤාණයෙන් බලනකොට සත්වයෝ ඉන්න තැන්, හැඩ තල ඔක්කෝම දකිනවා, බලනවා, පෙනෙනවා. කලින් දැකලත් තිබෙනවා. එවෙලටත් දකිනවා.

තවත් ලක්ෂණ තුනක් තිබෙනවා හිතේ තියාගන්න. යම් කිසි දෙයක් හේතුවකින් හටගන්නවානම් ඒ හේතුවෙන් හට ගත්ත දේ ඉන්ද්‍රිය බද්ධ හෝ වේවා අනින්ද්‍රිය බද්ධ හෝ වේවා දෙකේම තිබෙනවා ලක්ෂණ තුනක්. ඒ තමයි **'උප්පාදෝ පඤ්ඤායති' 'වයො පඤ්ඤායති' 'ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති'**.

- ***උප්පාදෝ පඤ්ඤායති*** = මතුවීමක් තිබෙනවා.
- ***වයො පඤ්ඤායති*** = නැති වීමක් තිබෙනවා.
- ***ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති*** = තිබෙන දේ අනෙක් ආකාරයකට පෙරෙලෙන ස්වභාවය තිබෙනවා.

මේක ඇත්තටම කියන්න ඕනෑ වෙන්නේ **උප්පාදෝ පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති, වයො පඤ්ඤායති** කියලා. නමුත් අපි කියන්නේ **උප්පාදෝ පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති** කියලා, ඒක දේශනා විලාසයක්. අපි හරි තැනට දාලා ගන්න ඕනෑ. හැම සංඛත ධර්මයකම මේ ධර්මතා තුන තිබෙනවා. මෙහෙම මතක තියා ගන්න කොට හරි ලේසියි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස **'ඛය ධම්මං' 'වය ධම්මං'** කියන දෙකේ වෙනසක් තිබෙනවද?

<u>පිළිතුර</u> - **'ඛය ධම්මං' 'වය ධම්මං' 'විරාග ධම්මං' 'නිරෝධ ධම්මං'** කියන ඒවායේ අර්ථ වල පොඩි පොඩි වෙනස් කම් තිබෙනවා. නමුත් බොහෝ දුරට සමානයි.

හොඳයි සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.